# <u>තනතුරු පුරප්පාඩුව</u>
# <u>මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව</u>
# <u>ශ්‍රී ලංකා වක්ෆ් සභාව</u>
# <u>නීති නිලධාරි (Legal Officer) තනතුර (කොන්ත්‍රාත් පදනම) පූර්ණ කාලීන.</u>

නීති නිලධාරි තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත පහත සුදුසුකම් සපුරාලන පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. ***සුදුසුකම්.***

(අ) අධ්‍යාපන සුදුසුකම්:

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු (Attorney-at-Law) ලෙස දිවුරුම් දී තිබිය යුතුය.

(ආ) පළපුරුද්ද

නීතිඥවරයෙකු ලෙස ලියාපදිංචි වීමෙන් පසු අවම වශයෙන් වසර 01ක ක්‍රියාකාරී නීති පරිචයක් හෝ වෘත්තීය නීති පළපුරුද්දක් තිබිය යුතුය.

(ඇ) අනෙකුත් සුදුසුකම්

- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ලිවීමේ හා කතා කිරීමේ නිපුණතාව සහ MS Office යෙදුම් පිළිබඳ දැනුම.
- ශ්‍රී ලංකාවේ වක්ෆ් (Wakfs) පනත පිළිබඳ දැනුම සහ අවබෝධය තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

2. ***වයස් සීමා***

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

3. ***වැටුප***

නීති නිලධාරි :රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 SL-1 ට අනුව - රු. 82,150 (2027) ක මූලික වැටුප සහ අදාළ අනෙකුත් දීමනා සමඟ සේ.අ.අ. / සේ.භා.අ. ගෙවනු ලැබේ.

4. **තනතුරට පත්කිරීමේ කොන්දේසි**

රැකියාව වසරක කොන්ත්‍රාත් පදනමක් මත වන අතර, කාර්ය සාධනය සහ ආයතන අවශ්‍යතා වලට යටත්ව එය අලුත් කල හැකිය.

5. ***සාමාන්‍ය සුදුසුකම්***

- ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය
- තනතුරේ රාජකාරි කිරීමට ශාරීරික හා මානසික වශයෙන් සුදුසු විය යුතුය.
- යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

6. ***බඳවා ගැනීමේ ක්‍රමය***

සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ.

**7.** ***අයදුම් කිරීමේ ක්‍රමවේදය :***

www.muslimaffairs.gov.lk වෙබ් අඩවියෙන් අයදුම්පත් ලබාගත හැකි අතර, සම්පූර්ණ කරන ලද අයදුම්පත් "අධ්‍යක්ෂ, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, අංක 180, ටී.බී. ජයා මාවත, කොළඹ 10" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අදාළ අයදුම්පත් 2026 ඔක්තෝම්බර් 08 වන දින හෝ ඊට පෙර ඉහත ලිපිනයට ලැබිය යුතුය.

සටහන: අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ **“මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව නීති නිලධාරි තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම”** යනුවෙන් සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ
මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
අංක 180, ටී.බී. ජයා මාවත, කොළඹ 10